(13)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2014
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 1½ |

නම :- ..................................................... විභාග අංකය :- .........................

සැලකිය යුතුයි:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) බිම්පලාසී රාගයේ මුඛ්‍යාංගය කුමක් ද?
(1) නි̣ ස ම ම ග ග ම ප නි ස්
(2) නි̣ ස ග ම ප ග ම ග ප ම
(3) නි̣ ස ම ම ග ප ම ග ම ග රි ස
(4) නි̣ ස ග ම ප - ග ම ප නි ස්

(02) යමන් රාගයේ ස්වර සංගතියක් නොවන්නේ,
(1) නි̣ ධ̣ නි̣ රි ග ම් ප
(2) ග රි ස̣ ධ ස රි ග ප ග
(3) නි̣ රි ග රි ස ප ම් ග රි ස
(4) නි̣ රි ග ම් ප රි ස

(03) I සාධු දන්ත දා, සැන්දෑ අහසේ
II යමුනා ගං තෙර, සීගිරියේ සිතුවම් රමණී
අංක I හා II යටතේ ඇති සරල ගී ආශ්‍රිත රාග පිළිවෙලින්,
(1) යමන්, බිම්පලාසි
(2) භූපාලි, බිම්පලාසි
(3) බිම්පලාසි, යමන්
(4) යමන්, භූපාලි

(04) විභාග 4කින් හා මාත්‍රා 14කින් යුත් හින්දුස්ථානි තාලය කුමක් ද?
(1) ජප් තාල්
(2) ත්‍රිතාල්
(3) කෙහෙරවා
(4) දීප්චන්දි

(05) හින්දුස්ථානි සංගීතයේ , රාග විස්තර ඇතුලත් ගීත විශේෂය කුමක් ද?
(1) මධ්‍යලය ගීත
(2) සර්ගම්
(3) ලක්ෂණ ගී
(4) සරල ගී

(06) "ස රි ග ම ප ධ නි ස්" යන බිලාවල් රාගයේ ආරෝහණ ස්වර මධ්‍යම භාවයෙන් ලියූ විට,
(1) ම ප ධ නි ස් රිං ගං මං
(2) ම ප ධ නි ස් රිං ගං මං
(3) ම්ʼ ප ධ නි ස් රිං ගං ම්ʼ
(4) ම්ʼ ප ධ නි ස් රිං ගං ම්ʼ

186

(07) දේශීය ක්‍රමයට අනුව තූර්ය භාණ්ඩ වර්ග කර ඇත්තේ,

(1) ආතත, විතත, ඝන, සුෂිර වශයෙනි

(2) ආතත, විතත, විතතාතත, ඝණ, සුෂිර වශයෙනි

(3) තත්, සුෂිර, ඝන, අවනද්ධ වශයෙනි

(4) ආතත, විතත, තත්, ඝණ, සුෂිර වශයෙනි

(08) හින්දුස්ථානි රාග මත ප්‍රබන්ධ වූ දෙවියන්ගේ ගුණ ගායනා කරන, භක්ති රසයෙන් යුත් ගායනා විශේෂය කුමක් ද?

(1) ලක්ෂණ ගීත (2) ප්‍රශස්ති (3) කව්වාලි (4) භජන්

(09) කව්වාලි ගායන ශෛලියට අනුව නිර්මාණය වූ සිංහල සරල ගීතයක් හා එය ගායනා කළ ගායකයා වනුයේ,

(1) රත්නදීප ජන්ම භූමි - W. D. අමරදේව

(2) සුවඳේ මට සීතල සුළඟ පවා - මොහිදීන් බෙග්

(3) මල්සරා බැල්ම හෙලා - රෝහණ බැද්දගේ

(4) ජයසිරි මහ බෝධි - දයාරත්න රණතුංග

(10) වික්ටර් රත්නායක ශූරීන් විසින් ගායනා කරන "ආදරයේ උල්පත වූ අම්මා" ගීතයේ තනු නිර්මාණය වී ඇත්තේ,

(1) දරු නැලවිලි ගී වල නාදමාලා ඇසුරෙන්

(2) වන්නම්, ප්‍රශස්ති නාදමාලා ඇසුරෙන්

(3) භජන් ගීතවල නාදමාලා ඇසුරෙන්

(4) හින්දුස්ථානී රාගාශ්‍රිත ගී තනු ඇසුරෙන්

(11) ගැමි ගී වර්ගීකරණයට අනුව මෙහෙ ගී නිර්මාණය වී ඇත්තේ,

(1) ගැමියන්ගේ ඇදහිලි හා විශ්වාස මත (2) ගැමියන්ගේ විනෝදාස්වාදය සඳහා

(3) ගැමියාගේ වෘත්තිමය ස්වභාවය අනුව (4) ගැමියන්ගේ සාමාජීය අවශ්‍යතා සම්බන්ධව

(12) පිළිවෙලින් ආතත, විතත, විතතාතත වාද්‍ය භාණ්ඩ වනුයේ,

(1) පහතරට බෙරය, තම්මැට්ටම, ගැටබෙරය

(2) ගැටබෙරය, දවුල, තම්මැට්ටම

(3) දවුල, පහතරට බෙරය, ගැට බෙරය

(4) ගැට බෙරය, තම්මැට්ටම, දවුල

(13) දේශීය නාට්‍ය කොටස් දෙකකට වර්ග කර ඇත. ඒ මොනවා ද?

(1) මුද්‍රා නාට්‍ය, ශෛලිගත නාට්‍ය

(2) ශෛලිගත නාට්‍ය, අර්ධශෛලිගත නාට්‍ය

(3) නව නාට්‍ය, මුද්‍රා නාට්‍ය

(4) ගැමි නාට්‍ය, අර්ධ ශෛලිගත නාට්‍ය

(14) අපරදිග මුද්‍රා නාට්‍යයක් වනුයේ,

(1) හුණුවටයේ කතාව (2) සිංහබාහු

(3) හංසවිල (4) කරදිය

The National e-learning Portal for General Education

(15) දකුණතින් ගීතයත් වමතින් තාලයත් (Bass and chords) රිද්මයානුකූලව එක් වූ විට නාද සංයෝගය මවන සුෂිර වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) රිදම් ගිටාරය
(2) මෙලෝඩිකාව
(3) විද්‍යුත් ගිටාරය
(4) එකෝඩියන්

(16) විද්‍යුත් අවනද්ධ වාද්‍ය භාණ්ඩය වනුයේ,

(1) ඔක්ටපෑඩ්
(2) සින්තසයිසරය
(3) බොක්ස්ගිටාරය
(4) එකෝඩියන්

(17) බටහිර සංගීතය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) විවිධ හඬතල මුසුවූ රාගධාරී සංගීත ක්‍රමයකි.
(2) හාර්මනි මත පදනම් වූ සංගීත ක්‍රමයකි.
(3) ප්‍රධාන හඬතල 4කින් සමන්විත ජන සංගීත වාදනයකි.
(4) සෑම ස්වරයක් ම එකිනෙක හාර්මනි වෙයි.

(18) අපරදිග සංගීතයේ දී Minim Rest (මිනිම් රෙස්ට්) Chrotchet Rest (ක්‍රොචට් රෙස්ට්) ආදී වශයෙන් හඳුන්වනුයේ,

(1) ඇදෙන මාත්‍රා (2) කෝමල ස්වර (3) නිශ්ශබ්ද මාත්‍රා (4) ශුද්ධ ස්වර

(19) $\frac{2}{4}, \frac{4}{4}, \frac{3}{4}, \frac{6}{8}$ ආදී වශයෙන් අපරදිග සංගීතයේ දක්වෙනුයේ,

(1) Minim Rest (2) Tie note (3) Key signature (4) Time signature

(20) සංගීතය හා තාක්ෂණය මුසුවීමේ දී මයික්‍රොෆෝනයේ කාර්යය වනුයේ,

(1) සංගීත නාදයේ කටහඬ වෙනස් කිරීමයි
(2) ශබ්දය ග්‍රහණය කරගැනීමයි
(3) ශබ්දය වැඩි කිරීමයි
(4) ශබ්ද තරංග මුදා හැරීමයි

e-තක්සලාව The National e-Learning Portal for the General Education

## II කොටස

- ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති වගුවට අනුව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රාගය | ආරෝහණ අවරෝහණ | ජාතිය | වාදී ස්වර | සංවාදී ස්වර | අනුවාදී ස්වර |
|---|---|---|---|---|---|
| යමන් | Ⓐ .................... ස් නි ධ ප ම් ග රි ස | Ⓑ .............. | ග | Ⓒ .............. | ස රි ම් ප ධ |
| Ⓓ .............. | නි ස ග ම ප නි ස් Ⓔ .................... | ඖඩව සම්පූර්ණ | ම | Ⓕ .............. | රි ග ප ධ නි |

(1) ඉහත වගුවෙහි Ⓐ සිට Ⓕ දක්වා හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු 1×6 = 06)

(2) ඉහත රාග දෙක අතරින් එක් රාගයක මධ්‍යලය ගීයේ හෝ සර්ගමයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(02) ගැමි ගී නිර්මාණය වීමේ දී ගැමි ජනතාවගේ රැකියා, ආගමික නැඹුරුව හා සමාජ අවශ්‍යතා යන කරුණු ප්‍රධාන තැනක් ගෙන ඇත.

(1) එම කරුණු මත ගොඩනැගුණු ගැමි ගී වර්ග 3ක් ලියන්න. (ලකුණු 03)

(2) ගැමි ගී වල විශේෂ ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 03)

(3) පහත ගැමි ගී පාද අයත් ගැමි ගී වර්ගය ලියන්න.

A - තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා

B - බුද්ධං සරණං සිරස දරාගෙන

C - දොයි දොයි දොයි දොයිය බබා

D - ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ (ලකුණු 04)

(03) නව නාට්‍ය ශෛලිය පිළිබඳ අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(1) ශ්‍රී ලංකාවේ නව නාට්‍ය කලාවේ නිර්මාතෘවරයා කවරෙක් ද? (ලකුණු 02)

(2) අභිනය හා මුද්‍රා පමණක් උපයෝගී කරගන්නා, සංගීතය ප්‍රධානව යොදාගන්නා නාට්‍ය විශේෂය කුමක් ද? (ලකුණු 02)

(3) නාට්‍ය පිළිබඳ ලියවුණු පැරණිම ග්‍රන්ථය කුමක් ද? (ලකුණු 02)

(4) නරිබෑණා නාට්‍ය, නාට්‍ය වර්ගීකරණයට අනුව කුමන වර්ගයට අයත් වේද? (ලකුණු 02)

(5) කැලිප්සෝ සංගීතය පිළිබඳ කරුණු 2ක් ලියන්න. (ලකුණු 02)

(04) (1) ව්‍යවහාරික සංගීතයේ දී භාවිතා කරන විද්‍යුත් ගිටාර වර්ග 3 නම් කරන්න.

(2) (i) - ශුද්ධ ස්වර

(ii) - කෝමළ ස්වර

(iii) - තීව්‍ර ස්වර

ඉහත ස්වර අපරදිග සංගීත ක්‍රමයට අනුව නම්කර සංකේත යොදන්න. (ලකුණු $1/2 \times 6 = 03$)

(3) සංගීත ප්‍රසංගයක දී භාවිතා කරන අත්‍යාවශ්‍ය තාක්ෂණික මෙවලම් 2ක් නම් කරන්න. (ලකුණු $2 \times 2 = 04$)

The National e-learning Portal For The General Education